# කාර්ය සාධන වාර්තාව

# 2023

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

**මහා භාණ්ඩාගාරය**

**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය - 244**

පටුන


| | |
|---|---|
| **1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | 1 |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ අභිමතාර්ථ | 1 |
| 1.3 ප්‍රධාන කාර්යයන් | 2 |
| 1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය | 2 |
| 1.3.2 පාලන හා මූල්‍ය අංශය | 5 |
| 1.4 2023 දෙසැම්බර් 31 වන දිනට සංවිධාන සටහන | 6 |
| | |
| **2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | 7 |
| 2.1 ප්‍රධාන ජයග්‍රහණ සහ අභියෝග | 7 |
| | |
| **3 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය** | 9 |
| 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 9 |
| 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 10 |
| 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 11 |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 12 |
| 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 18 |
| 3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය | 18 |
| 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව වෙත වැය දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 18 |
| 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය - 2023 | 18 |
| 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2023 | 18 |
| | |
| **4 කාර්යසාධන දර්ශක** | 19 |
| | |
| **5 තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDGs) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | 22 |
| 5.1 තිරසර සංවර්ධන අභිමතාර්ථ | 22 |
| | |
| **6 මානව සම්පත් පැතිකඩ** | 32 |
| 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය | 32 |
| 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 32 |
| 6.3 මානව සම්පත් සංවර්ධනය | 32 |
| | |
| **7 අනුකූලතා වාර්තාව** | 33 |

## 01. ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සහ ජනතාවගේ ශුභසාධනය උදෙසා විදේශ වෙළඳාම, ආයෝජන, දේශීය කර්මාන්ත හා කෘෂි කර්මාන්තය සඳහා පහසුකම් සැලසීමට තිරසාර තීරු බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම යි.

තවද ආනයන හා අපනයන රෙගුලාසි, රේගු පරිපාලනය, විදේශ විනිමය නියෝග, සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ක්‍රමය ඇතුළුව තීරු බදු සහන ප්‍රදානය/ ඉවත් කිරීම් හා වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු ලිහිල්කරණය සම්බන්ධිත ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ද මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

### 1.2 ආයතනික දැක්ම, මෙහෙවර, අරමුණු හා අභිමතාර්ථ

**දැක්ම**

රටේ සමස්ත සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගාමී ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම තහවුරු කිරීම.

**මෙහෙවර**

රට තුළ සමස්ත සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා ජාත්‍යන්තර ආර්ථික ඒකාබද්ධතාවයට ඉඩ සලසන්නා වූ වෙළඳ හා ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

**අරමුණු**

- වෙළඳ ප්‍රවර්ධන සහ කර්මාන්ත හිතකාමී තීරුබදු ක්‍රමවේදයක් පවත්වා ගැනීම.
- වෙළඳාම පහසු කිරීමේ දර්ශකය සඳහා පහසුකම් සැලසීමේ ප්‍රතිපත්ති පවත්වා ගෙන යාම.
- තරඟකාරී වාසි ලැබෙන පරිද්දෙන් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආර්ථික හා සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බදු සහන ක්‍රියාත්මක කිරීම.
- මෙම කලාපය තුළ ඍජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

අභිමතාර්ථ

- වෙළඳ කටයුතු ප්‍රවර්ධනය හා කර්මාන්ත සඳහා හිතකාමී මනා තීරුබදු ක්‍රමවේදයක් ඇති කිරීම.
- ආයෝජන අධෛර්යමත් කරන තීරුබදු සීමා ඉවත් කිරීම.
- අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් (TIEP) යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම.
- බන්ධිත ගුදම් සම්බන්ධිත ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සංවාද සංවිධානය කිරීම.
- සේවාලාභීන් සඳහා සහාය වන දත්ත පද්ධතියක් ඔස්සේ අවශ්‍ය තොරතුරු සැපයීම මඟින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම.
- රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු විධිමත් කිරීම.
- මෙරට වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත පදනම් වූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.
- ගෝලීය අගය දාම වෙළඳාම/කර්මාන්ත සඳහා ප්‍රවේශය සලසන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

### 1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය

වෙළඳ, කර්මාන්ත, කෘෂි කර්මාන්තය හා නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළව තීරුබදු ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සංශෝධනය සම්බන්ධයෙන් වෙළඳ ප්‍රතිපත්ති අංශය වගකීම දරනු ලැබේ. රේගු ආඥා පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීම, රේගු හා තීරුබදු ආශ්‍රිත ගැටලුවලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළුව රේගු පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම, මෝටර් වාහන ආනයනය සඳහා තීරුබදු සහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා විවිධ තීරුබදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කළ වාහන අපහරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මෙම අංශය වෙත පැවරී තිබේ. විදේශ විනිමය පනත යටතේ නියෝග නිකුත් කිරීමේ හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC), සාක් සංවර්ධන අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) සමඟ අදාළ කටයුතු සම්බන්ධීකරණය හා එම සංවිධාන තුළ මෙරට නියෝජනය කිරීම සහ ආනයන හා අපනයන

පාලන පනත යටතේ නියෝග හා නියමයන් නිකුත් කිරීමේ දී අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරී තිබේ.

මෙම අංශය මඟින් ඉටුවෙන ප්‍රධාන කාර්යයන් පහත විස්තරාත්මකව දක්වා ඇත;

**වෙළඳ ප්‍රතිපත්තිය**

i. මෝටර් වාහන ආනයන ප්‍රතිපත්තිය කළමනාකරණය
ii. වෙළඳ කටයුතුවලට අදාළ ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
iii. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන වෙළඳ කටයුතු ආශ්‍රිත ගැටලු විසඳීම
iv. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම
v. වෙළඳ කටයුතු ආශ්‍රිත අධිකරණ නඩු කටයුතු සඳහා වගඋත්තර සැපයීම
vi. වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ/ නිරීක්ෂණ සහ මතයන් ඉදිරිපත් කිරිම
vii. වෙළඳ /තීරු බදු සම්බන්ධිත අයවැය යෝජනා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
viii. රේගු ආඥා පනත යටතේ වන නියමයන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීම
ix. විදේශ විනිමය පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරිම / නියමයන් නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම
x. තක්සේරු කිරීම් ද ඇතුළුව රේගු කටයුතුවලට අදාළ අභියාචනා සමාලෝචනය කිරීම
xi. රේගු පරිපාලනය සම්බන්ධිත විගණන වාර්තා සමාලෝචනය
xii. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් යෝජනා ක්‍රමවල ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ සම්බන්ධීකරණය
xiii. බන්ධිත ගුදම් පහසුකම්වල ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xiv. ආනයන තාර්කිකකරණය පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xv. විදේශ විනිමය පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvi. ආනයන හා අපනයන පාලන පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvii. රේගු පරිපාලනය සම්බන්ධිත ද්විපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධීකරණය
xviii. වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම ඇතුළුව ලෝක වෙළඳ සංවිධානය ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය

**තීරුබදු ප්‍රතිපත්තිය**

i. රේගු ආඥාපනතේ 19 (අ) වගන්තිය යටතේ ප්‍රදානය කරන තීරුබදු ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය
ii. ආදායම් සංරක්ෂණ නියෝග ප්‍රකාශයට පත් කිරීම
iii. තීරුබදු විෂමතා ආශ්‍රිතව ඉදිරිපත් කරන ගැටලු විසඳීම

iv. නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක කළමනාකරණය
v. සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අනුකූලත්වය හා අතිස්ථාපනය කිරීම්
vi. තීරුබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු හා විකල්ප විශ්ලේෂණය කිරීම
vii. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත ක්‍රියාත්මක කිරීම
viii. තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම
ix. තීරුබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත පාර්ලිමේන්තු කටයුතු
x. තීරුබදු කටයුතු හා සම්බන්ධ ජාතික හා අන්තර්ජාතික ආයතන සමඟ සම්බන්ධීකරණය
xi. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන තීරුබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු විසඳීම
xii. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳ පත්‍රිකා සැකසීම
xiii. තීරුබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත අධිකරණ නඩු කටයුතු සඳහා වගඋත්තර සකස් කිරීම

**නිදහස් වෙළඳ ගිවිසුම්**

i. නිදහස් වෙළඳ ගිවිසුම්වලින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි වන බලපෑම විශ්ලේෂණය කිරීම
ii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අනුකූලව වෙළඳ ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම
iii. පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් තීරුබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:
   - ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
   - පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
   - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
   - ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
   - ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
   - බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC )
   - යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA), සහ
   - ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)

**විශේෂ යෝජනා ව්‍යාපෘති**

i. රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර්රථ ලබාගැනීම සඳහා වන යෝජනා ක්‍රමය
ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22 / 99 යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර


iii. විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය
iv. විවිධ තීරු බදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ අපහරණය කිරීම
v. රේගු ආඥා පනත යටතේ රේගු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම
vi. අපනයන සැකසුම් යෝජනා ක්‍රමය (TIEP) යටතේ ආනයනය කිරීම්
vii. රේගු බන්ධිත ගුදම් පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම සම්බන්ධීකරණය
viii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදලෙහි ප්‍රතිපාර්ශවීය ආයතනය ලෙස කටයුතු කිරීම ඇතුළුව සාර්ක් සංවර්ධන අරමුදලේ කටයුතු
ix. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමත කිරීම් සහ අභියාචනා කටයුතු සම්බන්ධීකරණය කිරීම

### 1.3.2 පාලන හා මූල්‍ය අංශය

මානව සම්පත්, වත්කම් හා මූල්‍ය සම්පත් කළමනාකරණය සඳහා පාලන හා මූල්‍ය අංශය වගකීම දරනු ලැබේ. දෙපාර්තමේන්තුව තුළ නිලධාරීන්ගේ ස්ථානගත කිරීම්, ධාරිතා සංවර්ධන හා ශුභසාධන කටයුතු මානව සම්පත් කළමනාකරණය යටතේ ඇතුළත් වේ. භෞතික හා මූල්‍ය සම්පත් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම හා වාර්තා පවත්වා ගැනීම භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ ආවරණය වේ.

මීට අමතරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්ය සාධන වාර්තා, වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම හා විගණන ගැටලු සම්බන්ධිත පසුවිපරම් කටයුතු පාලන හා මූල්‍ය අංශයේ විෂය පථයට ඇතුළත් වේ.

## 1.4 2023 දෙසැම්බර් 31 දිනට සංවිධාන ව්‍යුහය




**පරි.නිලධාරි :** පරිපාලන නිලධාරි
**තො.ස.තා.නි:** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
**ප්‍ර.ක.සේ.නි. :** ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
**සං.නි. :** සංවර්ධන නිලධාරී
**ක.සේ.නි. :** කළමනාකරණ සේවා නිලධාරි
**ක.කා.ස.:** කාර්යාල කාර්ය සහායක

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 ප්‍රධාන ජයග්‍රහණ හා අභියෝග

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යනු භාණ්ඩාගාර දෙපාර්තමේන්තු අතුරින් තීරු බදු සහ ආයෝජනවලට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අනාගත දැක්මට අනුකූලව පහසුකම් සලසන දෙපාර්තමේන්තුවකි.

ආර්ථික ස්ථායිකරණය, ආර්ථිකය යථා තත්ත්වයට පමුණුවාලීම සහ ආර්ථික වර්ධනය හා සම්බන්ධිත රජයේ ප්‍රයත්නයන් සමඟ අනුකූලව 2023 මූල්‍ය වර්ෂය තුළ, මෙම දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ මාර්ගෝපදේශ සහ නියෝග යටතේ විවිධ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

ඒ අනුව, 2020 අප්‍රේල් මාසයේ සිට භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් පනවා තිබූ සීමා, රටෙහි විදේශ සංචිත ක්‍රමයෙන් වැඩිදියුණු වීම සහ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුකූලව, ආර්ථික ස්ථායිකරණය, ආර්ථිකය යථා තත්ත්වයට පමුණුවාලීම සහ ආර්ථික වර්ධන පියවර සඳහා සහාය ලබාදීම සඳහා පියවරෙන් පියවර ඉවත්කිරීම අඛණ්ඩව සිදුවිය. 2023 දෙසැම්බර් මස අග භාගය වනවිට, සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල 87 වැනි පරිච්ඡේදයේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304ක් සඳහා හැරුන විට අනෙකුත් භාණ්ඩවලට අදාළව තාවකාලික වශයෙන් ආනයන අත්හිටුවා තිබීම ඉවත්කරන ලදී. එසේම 2023 දෙසැම්බර් සිට බලාත්මක වන පරිදි අත්‍යවශ්‍ය නොවන හා හදිසි භාවිතය සඳහා අවශ්‍ය නොවන භාණ්ඩ ආනයනයේ දී එම භාණ්ඩ මතවා තිබූ රේගු අධිභාරය ඉවත් කරන ලදී

අයවැය 2023 ඔස්සේ අනුමත වූ යෝජනාවක් ප්‍රකාරව, රේගු බදු නොවන ආනයනයේ දී පනවා ඇති අනෙකුත් බදු, එනම් සෙස් බද්ද සමාන වාරික තුනකින් ඉවත් කිරීම (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක කිහිපයක් හැරුනවිට) 2023 අප්‍රේල් මාසයේ දී ආරම්භ වූ අතර ආදායම් මධ්‍යස්ථ ගැලපුමක් සහිතව 0%, 10%, 15% මට්ටමේ පැවති තීරුබදු මට්ටම් 0%,15, 20% දක්වා වෙනස් කරන ලදී. මෙම රේගු බදු නොවන ආනයනයේ දී පනවා ඇති අනෙකුත් බදු ඉවත් කිරීමේ අරමුණ වූයේ අපනයන සඳහා අහිතකර ස්වභාවයේ තීරුබදු ව්‍යුහය ඉවත් කිරීම ඔස්සේ දේශීය කර්මාන්ත වර්ධනය සහ කලාපිය හා ගෝලීය අගය දාම සමඟ ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම වේ. වාර්ෂිකව ඇ.ඩො.බිලියන 10ක වටිනාකමක් දරන අපනයන ධාරිතාවයකට පවතින විභවය ලබාගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකාව විසින් අතපසු කර ඇති බව ලෝක බැංකුව විසින් සිදුකළ අධ්‍යයනක දී ඇස්තමේන්තු කර තිබෙන අතර මෙවැනි තත්ත්වයක් උද්ගතවී තිබෙනුයේ විවිධ සාර්ව ආර්ථික තීරණ සහ ආදායම් කේන්ද්‍රීය තිරු බදු ප්‍රතිපත්තිය හේතුවෙනි.

භාණ්ඩ හඳුනාගැනීම සහ වෙළඳ ප්‍රවාහ වෙත පහසුකම් සැලසීම තහවුරු කිරීම උදෙසා සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අදාළව යෝග්‍ය පරිද්දෙන් අනුපිළිවෙළවල් වෙනස්කිරීම හා යාවත්කාලීන කිරීම් සිදුකිරීම සඳහා 2022 අංක 07 දරන ආදායම් සංරක්ෂණ ආඥාව නිකුත් කිරීම සහ එය රේගු ආඥා පනතේ අ උපලේඛනයේ ඒකාබද්ධ කොටසක් ලෙස ක්‍රියාත්මක කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුව සමඟ සහයෝගීතාවයෙන් ලෝක රේගු සංවිධානයේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අදාළ HS 2022 සංස්කරණය, 2023 ජනවාරි සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක කර තිබේ.

අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව, ජනාධිපති කාර්යාලයේ අන්තර්ජාතික වෙළඳ කටයුතු සඳහා කාර්යාලය ලෙස හඳුන්වන අංශය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා- සිංගප්පූරු නිදහස් වෙළඳ

ගිවිසුමෙහි තීරුබදු ලිහිල්කරණ වැඩසටහන 2023 ජූලි සිට බලාත්මක වන පරිද්දෙන් නැවත ආරම්භ කරන ලදී.

අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ජාතික වෙළඳ එකඟතා කමිටුවේ මඟ පෙන්වීම යටතේ කර්මාන්ත, කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත, ධීවර, වෙළඳ හා වාණිජ අමාත්‍යාංශ, අපනයන සංවර්ධන මණ්ඩලය, වාණිජ දෙපාර්තමේන්තුව සහ අන්තර්ජාතික වෙළඳ කටයුතු සඳහා කාර්යාලය යන ආයතනවල නිලධාරීන් සමඟ සහයෝගීතාවයෙන් තායිලන්තය, ඉන්දියාව සහ බංග්ලාදේශය සමඟ ඇතිකර ගැනීමට යෝජිත වෙළඳ ගිවිසුම්වල භාණ්ඩ වෙළඳාම සම්බන්ධයෙන් ඇතිකරගත යුතු එකඟතා පිළිබඳ සාකච්ඡාවලට මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධ විය.

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකිරීමේ ගිවිසුම සමඟ අනුකූලවීම සහ වැඩිදියුණු වූ තරඟකාරිත්වය අරමුණු කරගෙන වෙළඳාම ආශ්‍රිත නියාමන පියවර කාර්යක්ෂම හා මනාව සංවිධිත කිරීමේ පියවරක් වශයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ප්‍රකාරව ආරම්භ වන යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික මට්ටමේ කටයුතු ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ හවුල්කාරිත්වයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. මෙම යෝජිත වෙළඳ ජාතික තනි කවුළුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන සම්පත් පවතින්නේ ද යන්න තවමත් අභියෝගාත්මක කරුණකි.

විනිවිදබවින් යුතු, සංගත, පුරෝකතනය කළ හැකි, සරල හා පහසු තීරුබදු ක්‍රමයක් තහවුරු කිරීමේ අභිප්‍රායෙන් , ජාතික තීරුබදු ප්‍රතිපත්ති රාමුව මේ වන විට කෙටුම්පත් කරමින් පවතී. ඉහත කරුණු අනුව, අදාළ අධිකාරීන්ගේ මඟ පෙන්වීම හා නියෝග යටතේ ආර්ථික ස්ථායිකරණය, ආර්ථිකය යථා තත්ත්වයට පමුණුවාලීම සහ ආර්ථික වර්ධනය සඳහා සහාය වීමට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත පවරන ලද විවිධ කාර්යයන් ඉටුකර තිබෙන බව සටහන් කිරීමට කැමැත්තෙමි. ආර්ථික ස්ථායිකරණය, ආර්ථිකය යථා තත්ත්වයට පමුණුවාලීම සහ වර්ධනය සම්බන්ධිත 2024 වර්ෂයේ ආර්ථික සංවර්ධන සැලැස්ම සඳහා සහාය වනු පිණිස වෙළඳ ප්‍රතිපත්තිවලට අදාළ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉටු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව කැපවී සිටී.

ගරු අමාත්‍යතුමා, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යවරු, භාණ්ඩාගාර ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරු, අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරු, රේගු අධ්‍යක්ෂ, ආනයන හා අපනයන පාලක, මෙම දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන අදාළ ආයතනවල නිලධාරීන් සහ මෙම දෙපාර්තමේන්තුවේ සහෝදර නිලධාරීන් යන සියලු දෙනාට ඔවුන්ගේ උපදෙස්, මඟ පෙන්වීම සහ සහාය ලබාදීම සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය පළකිරීම සඳහා මෙය අවස්ථාවක් කරගනිමි.

කේ.ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## 03. 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 79,217,400 | 63.031.000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 416,053 | 17.275 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 4,974,892 | 4.654.895 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **84,608,345** | **67,703,170** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **84,608,345** | **67,703,170** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | 49.539 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **84,608,345** | **67,653,631** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 50.655.790 | වැටුප්. වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 50,587,831 | 45.917.056 | ACA-2(ii) |
| 31.760.210 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 31,476,289 | 16.675.805 | ACA-2(ii) |
| 554.000 | සහනාධාර. ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 523.790 | 717.100 | ACA-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ACA-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ACA-2(ii) |
| 82.970.000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **82,587,910** | **63,309,961** | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | - | ඒසීඒ-2(ii) |
| 900.000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | - | 88.550 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 100.000 | හැකියා වර්ධනය | 14 | - | 55.773 | ඒසීඒ-2(ii) |
| 100.000 | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 1.100.000 | **මුළු මූලධන වියදම් ( උ)** | | - | **144,323** | |
| | තැන්පතු ගෙවීම් | | 416,053 | 17.275 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 4,094,212 | 4.239.406 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **4,510,265** | **4,256,681** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **87,098,175** | 67,710,965 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(2,489,830)** | **(57,334)** | |
| | **අග්‍රිම සැලසුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(2,489,830)** | (57.334) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | **(2,489,830)** | **(57,334)** | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 68,649,052 | 57,509,361 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 7,307,262 | 8,187,942 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | 75,956,314 | 65,697,303 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | - |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 7,307,262 | 8,187,942 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 68,649,052 | 57,509,361 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | 68,649,052 | 65,697,303 |

පිටු අංක 07 සිට 25 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ...................... | ...................... | ...................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2024.02. 27 | දිනය : 2024.02. 16 | දිනය : 2024.02. 16 |
| කේ.එම්.එම්. සිරිවර්ධන<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්<br>මුදල් අමාත්‍යාංශය<br>කොළඹ 01. | කේ. ඒ. විමලේන්තිරරාජා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01. | ඩබ්.ඒ. දමුතු විජේසිංහ<br>ගණකාධිකාරි<br>වෙළඳ හා අයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01. |

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 2,540,973 | 2.686.986 |
| අග්‍රිම ලැබීම් | 79,217,400 | 63.031.000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 5,292,503 | 5.271.629 |
| තැන්පතු ලැබීම් | 416,053 | 17.275 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **87,466,929** | **71,006,890** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 81,947,920 | 62.446.834 |
| සඟනාධාර සහ මාරුකිරීම් | 523,790 | 717.100 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 484,954 | 3.448.186 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 49.539 |
| අත්තිකාරම් ගෙවීම් | 4,094,212 | 4.239.406 |
| තැන්පතු ගෙවීම් | 416,053 | 17.275 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **87,466,929** | **70,918,340** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | - | **88,550** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | - | 88,550 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | - | **88,550** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | - | **(88,550)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

ඇමුණුම - (i)

# පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

**(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)**

**වියදම් ශීර්ෂ අංකය: 244** අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වැඩසටහන් අංකය හා නාමය :** 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | - | - |
| රු 25,000.01 | වැඩි | 1 | 447,600 |
| එකතුව | | 1 | 447,600 |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1. CAD 9008 දරණ මොටර් රථය අනතුරකට ලක්වීම | 1 | 447,600 |
| 2 | - | - |
| 3 | - | - |
| 4 | - | - |
| එකතුව | 1 | 447,600 |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| රු 25,000.00 | අඩු | - | - |
| රු 25,000.01 | වැඩි | - | - |
| එකතුව | | - | - |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | - | - |
| 2 | - | - |
| 3 | - | - |
| 4 | - | - |
| එකතුව | - | - |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | - |
| | ගණන | Rs. |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | - |
| | ගණන | Rs. |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | - |
| | ගණන | Rs. |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

............................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02./16

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

26

ඇමුණුම -(ii)

# පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

**වියදම් ශීර්ෂ අංකය : 244** අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය:1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | - | - | - |
| (ii) | රු. 25,000.01 වැඩි | - | - | - |
| | එකතුව | | - | - |

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|
| 1 - | - | - | - | - | - | - |
| | | | | | | |
| **එකතුව** | - | - | - | - | - | - |

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

..............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2024.02.16

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

Cumulative Commitment/ Liability Report for the Year - 2023

To
(244)
From
**Director General, ,**
**Department of State Accounts, ,**

**General Treasury, Colombo1. .**

Printed by: Rasmi
New Table No: :SA-92
Old Table No: :--
Report Date: 2/13/2024 9:21:40 AM

| Nature | Commit_No | Date | To_whom | Vote | Commitment | Commit_bal | L_Date | Liability_amt | Revised_Lia | Paid | Liability_Bal | Reported_By |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Govt | P2312/47 | 31 Dec 2023 | Government Printer | 244-1-1-0-1409-P | 129,778.54 | 0.00 | 31 Dec 2023 | 129,778.54 | 0.00 | 0.00 | 129,778.54 | 244 |

This is a computer-generated document. No signature is required.
Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan -Director, Dept of State Accounts.

# බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

## මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නාම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 244
වැඩසටහන් අංකය හා නාමය:1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

| පුද්ගලයාගේ/ආයතනයේ නාම | බැඳීම් පිළිබඳ විස්තරය | ව්‍යාපෘතිය | උප ව්‍යාපෘතිය | වැය විෂය සංකේතය | මූල්‍යකරණ සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැඳීම් හා බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| **1.** අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු | | | | | | | | |
| මුදල් අමාත්‍යාංශය | තැපැල් හා සන්නිවේදනය | 1 | 0 | 1402 | 11 | 701,500 | - | 62,539 |
| රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | වෙනත් සේවා | 1 | 0 | 1409 | 11 | 1,940,333 | - | 610,524 |
| එකතුව | | | | | | | | 673,063 |
| **2.** රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | | | | | |
| - | | - | - | - | - | - | | - |
| එකතුව | | | | | | | | - |
| **3.** වෙනත් (පෞද්ගලික අංශය) | | | | | | | | |
| කාර්යාල නිලධාරීන් | අතිකාල | 1 | 0 | 1002 | 11 | 313,833 | - | 105,085 |
| කාර්යාල නිලධාරීන් | වෙනත් දීමනා | 1 | 0 | 1003 | 11 | 6,767,333 | - | 471,028 |
| කාර්යාල නිලධාරීන් | දේශීය ගමන් වියදම් | 1 | 0 | 1101 | 11 | 56,333 | - | 8,900 |
| කාර්යාල නිලධාරීන් හා ආර්.එන්.එම්. ඇඩ්වර්ටයිසින් | තැපැල් හා සන්නිවේදනය | 1 | 0 | 1402 | 11 | 701,500 | - | 73,404 |
| දල්ප්‍රාක්ලින් (පුද්ගලික ) සමාගම | වෙනත් සේවා | 1 | 0 | 1409 | 11 | 1,940,333 | - | 52,009 |
| එකතුව | | | | | | | | 710,426 |
| මුළු එකතුව | | | | | | | | **1,383,489** |

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.16

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම - (vii)

# අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:** වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වියදම් ශීර්ෂ අංකය: 244**

වැඩසටහන් අංකය හා නාමය: 01. මෙහෙයුම් ක්‍රියාකාරකම්

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| - | - | - | - | - |

..........................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2024.02./16

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

* නම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

## 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2023.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 244 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2023.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | People's Bank | 14100169026611 | 1,999,580 | - | - | December |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

..............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02/16

ඩබ්.ඒ. දමුතු විජේසිංහ
ගණකාධිකාරි
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

31

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - 2023

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ඇස්තමේන්තුවේ % ලෙස |
| | | | | | අදාළ නොවේ |

**3.6** වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය -2023

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසන් ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 72,570 | 82,970 | 28,588 | 99 |
| ප්‍රාග්ධන | 1,100 | 1,100 | - | 0 |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනු අංකය | ප්‍රතිපාදනය කවර අමාත්‍යාංශයකින්/ දෙපාර්තමේන්තුව කින් ලැබුනේ ද යන වග | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනයේ %ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 01 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | WP CBH - 0478 වාහනය සඳහා ගෙවීම | 484 | 484 | 484 | 100 |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම් කිරීමට නියමිත | 2023.12.31 දිනට ප්‍රගතිය වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 6112 | යන්ත්‍රෝපකරණ හා උපකරණ | - | 33,051 | - | 100% |

**3.9** විගණකාධිපති වාර්තාව

ඇමුණුම බලන්න.

## 04. කාර්ය සාධන දර්ශක - 2023

| අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 90-100% | 75-89% | 50-74% |
| 1 | ද්වි පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 1.1 | ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | √ | | |
| 1.2 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | √ | | |
| 1.3 | පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | √ | | |
| 1.4 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| 1.5 | ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) | √ | | |
| 2 | යෝජිත වෙළඳ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 2.1 | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC ) | √ | | |
| 2.2 | යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| 2.3 | යෝජිත තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | √ | | |
| 2.4 | ඉන්දියාව සමඟ එලඹීමට නියමිත යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) | | | √ |
| 2.5 | යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | √ | | |
| 2.6 | සියලුම යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා පොදු නිශේධන ලැයිස්තුවක පිළියෙල කිරීම | √ | | |
| 3 | ජාතික සංවර්ධනය සඳහා තිරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 3.1 | ආදායම් සංරක්ෂණ ආඥාවලට අදාළ ගැසට් නිවේදන නිකුත්කිරීම | √ | | |
| 3.2 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළ ගැසට් නිවේදන නිකුත් කිරීම | √ | | |
| 3.3 | රේගු ආඥා පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරිම (අධිභාරය) | √ | | |
| 3.4 | සෙස් ගැසට් නිවේදන නිකුත් කිරීම | √ | | |
| 3.4.1 | සෙස් බද්ද හා සම්බන්ධිත කරුණු | √ | | |
| 4 | අපනයන තීරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරීමේ ප්‍රතිශතය | √ | | |
| 5 | ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම | √ | | |
| 6 | සංයෝජිත වර්ගීකරකරණ සංකේතාක - 2022 සංස්කරණයට අදාළව සිදුකළ යුතු කටයුතු | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 7 | දේශසීමා ආශ්‍රිත රේගු කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පැන නඟින ගැටලු අතුරින් විසඳූ ගැටලු සංඛ්‍යාව ප්‍රතිශතාත්මක ලෙස | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| 8 | ලෝක වෙළෙඳ සංවිධානයෙහි වෙළෙඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | √ |
| 9 | කර්මාන්ත/ අනෙකුත් සංවිධාන විසින් ඉදිරිපත් කළ වෙළඳ හා තීරුබදු ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් (වාර්ෂික අයවැය සඳහා ඉදිරිපත් කළ යෝජනා ද ඇතුළුව) විසඳුම් ලබාදීම | | | |
| 9.1 | කර්මාන්ත/ අනෙකුත් සංවිධාන විසින් ඉදිරිපත් කළ වෙළඳ හා තීරුබදු ආශ්‍රිත ගැටලු අතුරින් විසඳුම් ලබාදුන් ප්‍රතිශතය | √ | | |
| 9.2 | ආනයන හා අපනයන පාලන කටයුතුවලට අදාළ ඉල්ලීම්වලට විසඳුම් ඉදිරිපත් කිරීම | √ | | |
| 9.3 | ආධාර වශයෙන් ලැබෙන ආනයනවලට අදාළ කටයුතු නියාමනය හා පහසුකම් සැලසීම | √ | | |
| 9.4 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළව ලැබෙන ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීම | √ | | |
| 9.5 | කෙන්ද්‍රස්ථාන නියෝග | √ | | |
| 9.6 | තිරසර බලශක්තිය | √ | | |
| 9.7 | කොළඹ වරාය නගරය | √ | | |
| 9.7.1 | කොළඹ වරාය නගරය පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම | √ | | |
| 9.8 | ජාතික තනි කවුළුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | √ | |
| 10 | අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමවල (TIEP) සිදුකළ සංශෝධන ප්‍රතිශතාත්මක ලෙස | √ | | |
| 11 | අයවැය කතාවේ වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අයවැය යෝජනා අතුරින් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසූ අයවැය යෝජනා සංඛ්‍යාව ප්‍රතිශතාත්මක ලෙස | √ | | |
| 12 | රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ රේගු ආනයන තීරුබදු ඉවත් කිරීමේ සහන ලබාදීම් ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 12.1 | රේගු ආඥා පනතේ 19 අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | √ | | |
| 12.2 | රේගු ආඥා පනතේ 22 අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිඅපනයනය කිරීමේ පදනමින් භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | √ | | |
| 12.3 | රේගු ආඥා පනතේ 19 අ වගන්තියේ විධිවිධාන යටතේ පොදු මහජන යහපත සඳහා ආනයනය කරන භාණ්ඩවලට අදාළව තීරුබදු ඉවත්කිරීම් ප්‍රදානය කිරීම | √ | | |
| 12.4 | රේගු ආඥා පනතේ 19 අ වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද තීරුබදු ඉවත්කිරීම්වලට අදාළව ගැසට් නිවේදන නිකුත් කිරීම | √ | | |
| 13 | ද්වි පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම්වලට අදාළ ඒකාබද්ධ වෙළඳ කමිටු/ කවුන්සිලවලදී මුදල් ආමාත්‍යාංශය නියෝජනය කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| 14 | බන්ධිත ගුදම් ආශ්‍රිත කරුණු ක්‍රියාතමක කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.1 | බන්ධිත ගුදම් හා සම්බන්ධිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම | √ | | |
| 14.2 | බන්ධිත ගුදම් ස්ථාපනය කිරීම/ වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම/ඉවත් කිරීම | √ | | |
| 15 | පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 15.1 | පාර්ලිමේන්තු කමිටු/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සඳහා සහභාගීවීම | √ | | |
| 15.2 | ජනාධිපති කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම | √ | | |
| 16 | ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු/ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | | | |
| 16.1 | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම | √ | | |
| 16.2 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම | √ | | |
| 17 | දේශ සීමා/ රේගු කළමනාකරණය පිළිබඳ සංශෝධන සහ අභියාචනා පිළිබඳ කාර්යය නිමකිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස | √ | | |
| 18 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, මූල්‍ය බුද්ධි ඒකකය හා ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධිතව ඉදිරිපත් වූ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් කටයුතු ඉටු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස | √ | | |
| 19 | සාක් සංවර්ධන අරමුදලට (SDF) අදාළ කරුණු සම්බන්ධයෙන් අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව සහ පැවැත්වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 20 | වෙනත් විවිධ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දක්වා ඇති දායකත්වයේ ප්‍රතිශතය | √ | | |
| 21 | විවිධ තීරුබදු සහන යෝජනා ක්‍රම යටතේ යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ සම්බන්ධිත අපහරණය කිරීමේ ඉල්ලීම් අතුරින් අනුමැතිය ලබාදී ඇති ප්‍රතිශතය | √ | | |
| 22 | රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් සහිත නිලධාරීන් හා පළාත් ආණ්ඩුකාරවරු සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ ආනයනය කිරීම සඳහා බලපත්‍ර දීමේ දී ලැබී ඇති ඉල්ලීම් අතුරින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 23 | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීම් වලින් කටයුතු ඉටු කළ ඉල්ලීම්වල ප්‍රතිශතය | √ | | |
| 24 | මානව සම්පත් කළමනාකරණය යටතේ පවතින පුරප්පාඩු සඳහා බඳවාගත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව | √ | | |
| 25 | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර පවත්වාගැනීමේ කටයුතුවල ප්‍රගතිය ප්‍රතිශතාත්මකව | √ | | |
| 26 | ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව නිමකළ ප්‍රසම්පාදන සංඛ්‍යාවේ ප්‍රතිශතය හා ප්‍රසම්පාදනය සඳහා අයවැය ප්‍රතිපාදන උපයෝජනය වූ ප්‍රතිශතය | √ | | |
| 27 | වාහන සංචිතය නඩත්තු කිරීමේ කටයුතුවල ප්‍රගතිය ප්‍රතිශතාත්මකව | √ | | |
| 28 | අධිකරණ නඩු කටයුතු අතුරින් සහභාගී වූ/ අවසන් කළ නඩු කටයුතු සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 29 | මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට අදාළ ප්‍රගතියේ ප්‍රතිශතය | | | |

| | | | | |
|---|---|---|---|---|
| 29.1 | මූල්‍ය සම්පත් සැලසුම්කරණය | √ | | |
| 29.2 | ගනුදෙනු වාර්තා කිරීම | √ | | |
| 30 | දෙපාර්තුමේන්තුවට අදාළ විගණන විමසුම් (රජයේ විගණන, කළමනාකරණ විගණන, අභ්‍යන්තර විගණන) අතුරින් පිළිතුරු සැපයූ විගණන විමසුම් සංඛ්‍යාවේ ප්‍රතිශතය | √ | | |
| 31 | තොග ලේඛනගත භාණ්ඩ පැවතීමේ සහ වත්කම් සහ තොග ලේඛන කළමනාකරණය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය | √ | | |
| 32 | උපයෝගී සේවාවන් පවත්වාගෙන යෑම සඳහා ඇති වූ බාධාවන්හි ප්‍රතිශතය (දුරකතන, ඉන්ධන, පිරිසුදු කිරීම් සේවා හා තැපැල් සේවා) | √ | | |
| 33 | මාසික සහ කාර්තුමය වාර්තා පිළියෙල කිරීමේ කටයුතුවල ප්‍රතිශතය | √ | | |
| 34 | කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමේ කටයුතුවල ප්‍රතිශතය | √ | | |

## 05. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමේ කාර්ය සාධනය -2023

| තිරසර සංවර්ධන අභිමතාර්ථ - 2023 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අභිමතාර්ථ සඳහා අදාළ අංකය | අභිමතාර්ථය | ඉලක්ක (අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්) | අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සම්බන්ධිත දර්ශක | මේ දක්වා ජයග්‍රහණ අත්කර ගැනීමේ ප්‍රගතිය | | |
| | | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 1. | ඉලක්කය 17 | තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කළ හැකි විවිධ ක්‍රම හා නව පණ ගැන්වීම් ශක්තිමත් කිරීම | දැනට පවතින ද්විපාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම | | | | |
| 1.1 | | | ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | නිකුත් කළ ආදායම් සංරක්ෂණ ආඥා සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳු ගැටලු සංඛ්‍යාව | | | √ |
| 1.2 | | | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | නිකුත් කළ ආදායම් සංරක්ෂණ ආඥා සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම් කිසිවක් පැනනැගී නොමැත. | | |
| | | | | සකස්කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| 1.4 | | | පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | නිකුත් කළ ආදායම් සංරක්ෂණ ආඥා සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම් කිසිවක් පැනනැගී නොමැත | | |
| | | | | විසඳනු ලැබූ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධිත ගැටලු සංඛ්‍යාව | | | √ |
| 1.4 | | | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | නිකුත් කළ ආදායම් සංරක්ෂණ ආඥා සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ගැටලු කිසිවක් පැනනැගී නොමැත | | |
| | | | | විසඳනු ලැබූ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධිත ගැටලු සංඛ්‍යාව | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1.5 | | | ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) | වෙළඳ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| 2 | | | යෝජිත වෙළඳ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීමේ කටයුතු | | | | |
| 2.1 | | | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC ) | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |
| 2.2 | | | යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ගැටලු කිසිවක් පැනනැගී නොමැත | | |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | |
| 2.3 | | | යෝජිත තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |
| 2.4 | | | ඉන්දියාව සමඟ එලඹීමට නියමිත යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |
| 2.5 | | | යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |
| 2.6 | | | සියලුම යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා පොදු නිශේධන ලැයිස්තුවක පිළියෙල කිරීම | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |
| 3 | | | ලෝක වෙළෙඳ සංවිධානයෙහි වෙළෙඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා | සහභාගී වූ රුස්වීම් ගණන | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | සහයෝගය ලබා දීම | ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | √ | |
| 4 | | | ද්වි පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන ඒකාබද්ධ වෙළඳ කම්ටු | සහභාගී වූ රැස්වීම් ගණන | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| | | | | ලැබී ඇති අබබෝධතා ගිවිසුම් සංඛ්‍යාව | | | |
| | | | | යෝජිත සංශෝධන සංඛ්‍යාව | | | |
| 5 | | | සාක් සංවර්ධන අරමුදලට (SDF) අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් | | | √ |
| 6 | | | දේශසීමා/ රේගු කළමනාකරණ කටයුතු සඳහා ප්‍රතිපත්ති සැකසීම | රේගු ආඥා පනත සඳහා සිදුකළ සංශෝධන සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| | | | | විභාග කර නිමකළ පැමිණිලි සංඛ්‍යාව | | | |
| 7 | ඉලක්කය **16** | තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම | පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ සභා/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව | | | | |
| 7.1 | | | පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ සභා/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සඳහා සහභාගීවීම | සහභාගී වූ රැස්වීම් ගණන | | | √ |
| | | | | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| 7.2 | | | ජනාධිපති කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම | සහභාගී වූ රැස්වීම් ගණන | | | √ |
| | | | | පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව | | | √ |
| 8 | | | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු/ අමාත්‍ය මණ්ඩල සංදේශවලට නිරීක්ෂණ සකස් කිරීම | | | | |
| 8.1 | | | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම | ලැබී ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | | | √ |
| | | | | පාර්ලිමේන්තු ප්‍රශ්න අයුරින් පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8.2 | | | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම | නිරීක්ෂණ ඉල්ලා ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ නිරීක්ෂණ සංඛ්‍යාව | | | √ |
| 9 | | | දේශසීමා/ රේගු කළමනාකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම | රේගු ආඥා පනත සඳහා සිදුකළ සංශෝධන සංඛ්‍යාව | | | √ |
| | | | | අවශ්‍ය කටයුතු නිමකළ අභියාචනා සංඛ්‍යාව | | | √ |
| 10 | | | අයවැය කතාවේ වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම කිරීම සඳහා පහසුකම් සැලසීම | පිළියෙල කළ වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| 11 | **ඉලක්කය 16** | | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, මූල්‍ය බුද්ධි ඒකකය හා ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධිත අනෙකුත් කරුණු | විදේශ විනිමය පනත සඳහා සිදුකළ සංශෝධනවල සංඛ්‍යාත්මක අගය | | | √ |
| | | | | නිකුත් කළ නියෝග හා නියමයන් සංඛ්‍යාව | | | √ |
| | | | | නිකුත් කළ විධාන සංඛ්‍යාව | | | √ |
| | | | | පහසුකම් සැපයූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 12 | | | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත | තොරතුරු ඉල්ලීම් අතුරින් පිළිතුරු ලබාදුන් සංඛ්‍යාව | | | √ |
| | | | | කටයුතු ඉටු කළ අභියාචනා සංඛ්‍යාව | | | √ |
| 13 | | | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු සඳහා බඳවාගත් මානව සම්පත | | | √ |
| 14 | | | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර පවත්වාගැනීම | කාර්යසාධන ඇගයීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ලබා දී ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 15 | | | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව නිමකළ ප්‍රසම්පාදන කටයුතුවල සංඛ්‍යාත්මක අගයේ ප්‍රතිශතය | | | √ |
| | | | | අයවැය ප්‍රතිපාදන උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | | | √ |
| 16 | | | වාහන සංචිත කළමනාකරණය | වසර තුළ අලුත්වැඩියා කළ වාහන සංඛ්‍යාව | | | √ |
| | | | | ලැබී ඇති විගණන විමසුම් සංඛ්‍යාව | | | √ |
| 17 | | | අධිකරණ නඩු කටයුතු | ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබූ නඩු සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් වූ අධිකරණ නඩු කටයුතු සංඛ්‍යාව | | | √ |
| 18 | | | මූල්‍ය කළමනාකරණය | | | | |
| 18.1 | | | මූල්‍ය සම්පත් සැලසුම් කිරීම | ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ ප්‍රතිශතය | | | √ |
| | | | | ලැබූ අත්තිකාරමේ ප්‍රතිශතය | | | √ |
| | | | | නියමිත කාල ඉලක්කවලට පෙර හෝ එදිනට පිළියෙල කළ ගිණුම්/සාරාංශ/වාර්තාවල සංඛ්‍යාත්මක අගය | | | √ |
| 18.2 | | | ගනුදෙනු වාර්තා කිරීම | නියමිත කාල සීමා තුළ ඉදිරිපත් කළ මාසික ගිණුම් සාරාංශවල සංඛ්‍යාත්මක අගය | | | √ |
| | | | | පාලන ගිණුම් සහ සැසඳුම් සංඛ්‍යාව | | | √ |
| 19 | **ඉලක්කය 16** | | දෙපාර්තුමේන්තුව ට අදාළ විගණන විමසුම් (රජයේ විගණන, කළමනාකරණ විගණන, අභ්‍යන්තර විගණන) සඳහා පිළිතුරු සැපයීම | පිළිතුරු සැපයූ විගණන විමසුම් සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | | | වත්කම් හා තොග ලේඛන කළමනාකරණය | තොග අයිතම පැවතීම | | | √ |
| | | | | නියම කර ඇති කාල සීමාව තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම | | | √ |
| 21 | | | උපයෝගී සේවාවන් පවත්වාගෙන යෑම (දුරකථන, ඉන්ධන, පිරිසුදු කිරීම් සේවා හා තැපැල් සේවා) | උපයෝගී සේවාවන් සඳහා ඇතිවූ බාධාවන්හි සංඛ්‍යාත්මක අගය | | | √ |
| 22 | ඉලක්කය 16 | තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම | මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කිරීම | පිළියෙල කළ මාසික වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | පිළියෙල කළ කාර්තුමය වාර්තා සංඛ්‍යාව | | | √ |
| 23 | | | කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම | නියම කර ඇති කාල සීමාව තුළ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම | | | √ |
| 24 | | | විවිධ කටයුතු | ඉටු කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | | | √ |
| 25 | ඉලක්කය 12 | පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම | බන්ධිත ගුදම් සම්බන්ධිත ගැටලු | | | | |
| 25.1 | | | බන්ධිත ගුදම් සම්බන්ධිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම | ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව | | | √ |
| | | | | සංශෝධනය කරන ලද ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සංඛ්‍යාව | | | √ |
| 25.2 | | | බන්ධිත ගුදම් ස්ථාපනය කිරීම/ වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම/ඉවත් කිරීම | බන්ධිත ගුදම් ස්ථාපනය කිරීම/ වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම/ඉවත් කිරීම සඳහා ලබාදී ඇති අනුමැතීන් | | | √ |
| | | | | භාණ්ඩාගාර ලේකම් විසින් ලබා දී ඇති අනුකූලතා අනුමැතීන් | | | √ |
| 26 | | | විවිධ තීරුබදු සහන යටතේ ආනයනය කළ මෝටර් වාහන අපහරණය කිරීම | ලබා දී ඇති අනුමැතීන් සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 27 | | | රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් සහිත නිලධාරීන් හා පළාත් ආණ්ඩුකාරවරු සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ ආනයනය කිරීම සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | චක්‍රලේඛය සඳහා එකතු කළ සංශෝධන | | | √ |
| | | | | චක්‍රලේඛ අංක 01/2018 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | | | √ |
| | | | | පිළිතුරු සැපයූ/ අවශ්‍ය කටයුතු සිදුකරන ලද පැමිණිලි හා අභියාචනා සංඛ්‍යාව | | | √ |
| | | | | පළාත් ආණ්ඩුකාරවරුන් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ගැටලු කිසිවක් පැනනැඟී නොමැත. | | |
| | | | | චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | | | √ |
| 28 | | | අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමවල (TIEP) සිදුකළ සංශෝධන | පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| | | | | පිළියෙල කළ ලේඛන සංඛ්‍යාව | | | √ |
| 29 | ඉලක්කය 12 සහ ඉලක්කය 8 | පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම<br><br>සහ<br><br>සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම | ජාතික සංවර්ධනය සඳහා තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම | | | | |
| 29.1 | | | ආදායම් සංරක්ෂණ ආඥා වලට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | ආදායම් සංරක්ෂණ ආඥා ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 29.2 | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 29.3 | | | රේගු ආඥා පනත යටතේ නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව (ආනයන තීරු බද්ද මත අධිභාරය) | ආදායම් සංරක්ෂණ ආඥා ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 29.4 | | | සෙස් බද්දට අදාළ ගැසට් නිවේදන නිකුත් කිරීම | සෙස් බදු ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 29.4.1 | | | සෙස් බද්දට අදාළ කරුණු | පිළියෙල කළ වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| 30 | | | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නව සංස්කරණය - 2022 | පිළියෙල කළ ලේඛන සංඛ්‍යාව | | | √ |
| | | | | සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අදාළ සංශෝධන නිම කිරීම | | | √ |
| 31 | | | අපනයන සඳහා තිරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරීම | පැවැත්වූ රැස්වීම් ගණන | | | √ |
| | | | | ප්‍රකාශයට පත්කළ බදු සංඛ්‍යාව | | | √ |
| 32 | | | ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම | නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | සකස් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 33 | **ඉලක්කය 8** | සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම | කර්මාන්ත/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරන ගැටලු සංඛ්‍යාව | | | | |
| 33.1 | | | කර්මාන්ත/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරන වෙළඳ/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරන ගැටලු සඳහා විසඳුම් ලබාදීම | පිළියෙල කළ වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 33.2 | | | ආනයන හා අපනයන පාලනයට අදාළ ඉල්ලීම් විසඳීම | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| | | | | පනවනු ලැබූ රෙගුලාසි සංඛ්‍යාව | | | √ |
| 33.3 | | | ප්‍රදාන වශයෙන් ලැබෙන ආනයනික සඳහා නියාමනය හා පහසුකම් සැලසීම | ලැබූ ප්‍රදාන සංඛ්‍යාව | | | √ |
| 33.4 | | | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළව ලැබෙන ඉල්ලීම් සංඛ්‍යාව | පිළියෙල කළ වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 33.5 | | | කේන්ද්‍රස්ථාන නියෝග | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | | √ |
| | | | | පිළියෙල කරන ලද වාර්තා/ ලිපි සංඛ්‍යාව | | | | √ |
| | | | | සංවිධානය කරන ලද/ සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව | | | | √ |
| 33.6 | | | තිරසර බලශක්තිය | පිළියෙල කරන ලද වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | | √ |
| 33.7 | | | කොළඹ වරාය නගරය | පිළියෙල කරන ලද වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | | √ |
| 33.7.1 | | | කොළඹ වරාය නගරය පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම | නිකුත් කරනලද ගැසට් නිවේදන සංඛ්‍යාව/ ඉදිරිපත් කළ නිරීක්ෂණ සංඛ්‍යාව | | | | √ |
| 33.8 | | | ජාතික තනි කවුළු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | පිළියෙල කළ ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | | | | √ |
| | | | | ආධාර ප්‍රදාන නියෝජිතායතන සමඟ පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | | | | √ |
| 34 | | | රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම | | | | | |
| 34.1 | | | රේගු ආඥා පනතේ 19 අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 34.2 | | | රේගු ආඥා පනතේ 22 අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රති-අපනයන පදනමින් භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව | | | √ |
| 34.3 | | | රේගු ආඥා පනතේ 19 අ වගන්තියේ විධිවිධාන යටතේ පොදු යහපත සඳහා භාණ්ඩ ආනයනය කිරීමේ දී තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | √ |
| 34.4 | | | රේගු ආඥා පනතේ 19 අ වගන්තිය යටතේ නිකුත් කළ තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ගැසට් නිවේදන නිකුත් කිරීම | ප්‍රකාශයට පත්කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |

## 06. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**2023 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව**

| මට්ටම | අනුමත සේවක | දැනට සිටින | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 15 | 02 |
| තෘතීයික | 04 | 03 | 01 |
| ද්විතියික | 28 | 24 | 04 |
| ප්‍රාථමික | 15 | 10 | 05 |
| **එකතුව** | 64 | 52 | 12 |

### 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 64කි. ඒ අනුව ඉහත වගුව මඟින් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය දක්වා ඇත. 2023 වර්ෂයේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 12 ක් පැවති අතර, දැනට සිටින කාර්ය මණ්ඩලය ඵලදායි අයුරින් යොදා ගැනීම ඔස්සේ දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගෙන තිබේ. දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීමේදී කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පැන නඟින සැලකිය යුතු තරමේ ගැටලුවලට මෙම දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදු නොවිණි.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුව තුළ ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා, දැනුම හා ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත්, ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කැපවීමක් සහිත ධනාත්මක පෞරුෂත්වයකින් හෙබි තැනැත්තන් දෙපාර්තමේන්තුව තුළ වර්ධනය කරගැනීම සඳහා දේශීය හා විදේශීය පුහුණු ලබාදීම වැදගත් වේ.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදෙන ලදී.

## 07. අනුකූලතා වාර්තාව - 2023

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සදහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සදහන් මූල්‍ය ප්‍රකාශන /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ. | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ. | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA — N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **03** | **මූල්‍ය පාලනය සදහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබද ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම. | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කර තිබීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කර තිබීම | අදාළ නොවේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට දිනට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) , කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම. | අදාළ නොවේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම. | අදාළ නොවේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා සහ වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකර තිබේ. | අනුකූල වේ. | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අදාළ නොවේ. | | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය අනුව සෑම මෝටර් රථයකම ඉන්ධන දහනය පිළිබඳව නැවත පරීක්ෂා කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, අදාළ වාහන සම්බන්ධිත ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාළ නොවේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු .රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා යන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම. | | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කර සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම. | අදාළ නොවේ. | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය බඳවාගෙන වැටුප් ගෙවීම් සිදුකර තිබීම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | MSD 04/2017 සහ 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර හරහා මහජනයා වෙත ලබා දීම හා වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර ඔස්සේ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව ආයතනය විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | යම් මට්ටමකට අනුකූල වේ. | අදාළ අයවැය චක්‍රලේඛය පරිදි | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

ඇමුණුම

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | TPD/B/DTIP/02/23/19 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2024 මැයි 27 දින | |

ගණන්දීමේ නිලධාරී

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.4,537,200 ක අමතර ප්‍රතිපාදන ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 02 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයන්ගෙන් එකතුව රු.1,861,210 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) **South Asia Free Trade Agreement (SAFTA)**

සාර්ක් කලාපීය රටවල් 8 ක සහභාගීත්වයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැෆ්තා / SAFTA) සඳහා ශ්‍රී ලංකාව 2005 වර්ෂයේදී අත්සන් කර තිබුණි. මෙම වෙළඳ ගිවිසුමේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර අවසාන බාණ්ඩය යටතේ සකස් වී ඇති රේගු සංකේතාංක 50 (සංකේත 8කින් යුත්) සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන තීරු බදු කපා හැරීම සියයට 7.5 හා සියයට 6 ක ප්‍රමාණය 2018 දෙසැම්බර් මාසය වන විට සියයට 5 දක්වා අඩු කිරීමට යෝජනා වී තිබුණ ද, එය 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉටු වී නොතිබුණි.

(ආ) **බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA)**

ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් වන සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2021 ජුනි 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. එම කාර්යයට අදාළව ඉදිරිපත් කර තිබූ දත්ත අනුව 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාමෙන් යහපත් වෙළඳ ශේෂයන් සහ ඉහළ ආනයන ආවරණ අනුපාතයක් දෙරට අතර වෙළඳාම මඟින් අය කර ගෙන තිබුණි. ඒ අනුව, බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA) අත්සන් කිරීමට අදාළ වැඩ සැලැස්මක් (Work Plan) සඳහා එකඟතාවයකට පැමිණ, දෙරට අතර ගිවිසුම අත්සන් කිරීම 2022 ජනවාරි මසට යෙදී තිබුණ ද, එය 2023 දෙසැම්බර් මස 31 දින වන විටත් අත්සන් කර නොතිබුණි.

(ඇ) **චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළඹීම සම්බන්ධ සාකච්ඡා 2014 වර්ෂයේ ආරම්භ වී 2017 වර්ෂය දක්වා පවත්වා තිබුණි. පසුව, නැවත 2022 වර්ෂයේදී සාකච්ඡා ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමෙන් පවතින බව නිරීක්ෂණය විය.

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම, සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව අවස්ථා 14 ක දී එකතුව රු.941,291 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 64 ක් වූ අතර, 2024 අප්‍රේල් 30 දින වන විට ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් සහ ද්විතියික මට්ටමේ තනතුරු 03ක් තවදුරටත් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට